# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,931 — 1970 නොවැම්බර් 5 වැනි බ්‍රහස්පතින්ද — 1970.11.5**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි.)**


# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 785 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 793 |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 787 | අය-වැය ලේඛන ... ... ... | 794 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 790 | ශල්‍යපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 791 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 793 | විවිධ දැන්වීම් ... ... ... ... | 797 |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ හා උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## පළාත් පාලන නිවේදන

### නගර සහ ග්‍රාම නාම වෙනස් කිරීම

මෙහි පහත සඳහන් පළමුවැනි උපලේඛනයේ ඇති ග්‍රාම නාමය දෙවැනි උපලේඛනය ප්‍රකාරව වෙනස් කරන්නට යෙදුන බැව් පොදු දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

fපිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු ඇමති කාර්යාලය,
කොළඹ 7,
1970 ඔක්තෝබර් මස 30 වැනි දින.

| දිස්ත්‍රික්කය | පළමුවැනි උපලේඛනය | දෙවැනි උපලේඛනය |
|---|---|---|
| කොළඹ ... | ගවගමුව ... ... | නවගමුව |

11-259—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත

**ගම්සභා ආඥාපනතේ 17 (5) දරණ වගන්තිය යටතේවූ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 17 (5) වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, මොණරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් හත්තොටුව ගමගේ ආනන්ද වන මා විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ගම්සභාවේ රැස්වීමක් 1970 නොවැම්බර් මස 11 වැනි දින පෙරවරු 11 ට බිබිල ගම්සභා කාර්යාලයේ දී, එම ගම්සභාවට සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීම පිණිස මෙයින් කැඳවා සිටිනු ලැබේ.

එච්. ජී. ආනන්ද,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල.

1970 ඔක්තෝබර් මස 26 වැනි දින,
මොණරාගල පළාත් පාලන කාර්යාලයේ දී ය.

11-173—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජුනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### රත්තොට සුළු නගර සභාවේ සීමා දීර්ඝ කිරීම

ගරු රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති විසින්—

(1) මාතලේ කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් කේ. ඇම්. අබේසිංහ මහතා,

(2) රත්තොට ප්‍රාදේශීය ආදායම් නිලධාරි,

(3) දඹුල්ල සහකාර මැනුම් අධිකාරි එන්. අබේසිරි මහතා

යන අයගෙන් සමන්විත නිල කමිටුවක් පහත සඳහන් කරුණු පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස, පත් කර ඇති බැව් මෙයින් නිවේදනය කරමි:—

(අ) දැනට රත්තොට සුළු නගර සභා සීමාවලින් පිටස්තරව ඇති යම් කිසි ප්‍රදේශයක් එම සුළු නගර සභා සීමාව තුළට ඒකාබද්ධ කළ යුතුද ;

(ආ) සභිකයකු නියෝජනය කරන එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාව හැකිතාක් දුරට සමාන වනසේ ප්‍රදේශයේ විශාලත්වය, ජනගහණය හා වෙනත් හේතු සාධක සලකා බලා රත්තොට සුළු නගර සභාව සමන්විත විය යුතු සභික සංඛ්‍යාව ;

(ඇ) සුළු නගර සභාවේ සීමාවල විස්තර ; සහ

(ඇ) සුළු නගර සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවල විස්තර සම්බන්ධ කරුණු ගැන පරීක්ෂා කොට වාර්තා කිරීම.

මේ සම්බන්ධයෙන් නියෝජනයන් ඉදිරිපත් කිරීමට කැමති සංවිධාන හා මහජනයා 1970 නොවැම්බර් මස 20 දිනට පෙර එවැනි නියෝජනයන් පිටපත් 3 කින් යුතුව, ලිඛිතව, මාතලේ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබෙන් නට ලියා පදිංචි තැපෑලෙන් එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

කේ. එම්. අබේසිංහ,
නිල කමිටුවේ සභාපති හා පළාත් පාලන සහකාර
කොමසාරිස්, මාතලේ.

11–228—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතේ 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, මාතලේ දිසාවේ සහකාර පළාත් පාලන කොමසාරිස්, කෝනාර මුදියන්සේලාගේ අබේසිංහ වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සියපත්තුව ගම්සභාවේ අංක 21 දරණ කොට්ඨාශයේ සභික දිසානායක මුදියන්සේලාගේ ලොකුබණ්ඩා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට (3) වැඩි ගණනකට, තමන් තෝරාපත්කර ගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සියපත්තුව ගම්සභාවේ අංක 21 දරණ කොට්ඨාශයේ සභික දිසානායක මුදියන්සේලාගේ ලොකු බණ්ඩා මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල කිරීමේ දින සිට සාමාජිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ. ඇම්. අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මාතලේ.

1970 ක්වූ ඔක්තෝබර් මස 25 වෙනි දින,
මාතලේ පළාත් පාලන කායර්ාලයේදීය.

11–186—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරන ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වන අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මඩකලපුව ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් බර්ට්‍රම් ආර්නල්ඩ් ජෙයරාජා කාසිනාදර් වන මම, මඩකලපුව දිස්ත්‍රික්කයේ පුදුකුඩියිරුප්පු ගම්සභාවේ අංක 5 දරණ කොට්ඨාශයේ සභික පොන්නයියා සින්නතම්බි මහත්මයා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බවට සෑහීමකට පත්ව, මඩකලපුව දිස්ත්‍රික්කයේ පුදුකුඩියිරුප්පු ගම්සභාවේ අංක 5 දරන කොට්ඨාශයේ සභික පොන්නයියා සින්නතම්බි මහත්මයා මේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

බී. ඒ. ජේ. කාසිනාදර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මඩකලපුව.

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ කායර්ාලය,
මඩකලපුව, 1970.10.27.

11–156—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තම්බියාහිබු අයිදුරුස් කමාල්දීන් වන මම, හපුගොල්ල-කිරවනාගම ගම්සභාවේ අංක 3 දරණ කොට්ඨාශයේ නියෝජිත රත්නායක මුදියංසේලාගේ උක්කුබංඩා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනක් තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව බදුල්ල දිස්ත්‍රික්කයේ හපුගොල්ල-කිරවනාගම ගම්සභාවේ අංක 3 දරණ කොටසේ සභික රත්නායක මුදියංසේලාගේ උක්කුබංඩා මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. අයි. කමාල්ඩීන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
බදුල්ල.

1970.10.23 වැනි දින,
බදුල්ලේ පළාත් පාලන අමාත්‍යාංශයේ
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

11–196—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 (5) වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත, ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ජයනාදිපතිගේ ගුණපාල කීර්තිරත්න වන මා විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ අවුලුගම ගම්සභාවට සභාපතිතුමකු තෝරා පත්කර ගැනීම සඳහා සභා රැස්වීමක් 1970 නොවැම්බර් මස 12 වැනි දින පෙ. ව. 10.30 ට දෙහිඕවිට පිහිටි අවුලුගම් කෝරළේ ගම්සභා කාර්යාලයේදී මෙයින් කැඳවනු ලැබේ.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල දිස්ත්‍රික්කය.

1970 ඔක්තෝබර් මස 27 වැනි දින,
කෑගල්ලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

11–179—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) 1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද, කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතට මාරුකරනු නොලැබූ ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයින් විසින් උසුලනු ලබද්දී, 1962 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකර හරිනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශ කරනු නොලැබූ තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් වූ විට, එම තනතුරුවලට පත්කරනු ලබන අය 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතෙහි 18 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට, ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) දයක මුදල් වශයෙන් ගෙවිය යුත්තාහ. අදළ නිලධාරීන්ගේ වැටුපෙන් සියයට හත හමාරක් (7½%) ඔවුන් පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔවුන් වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ඉ) ස්ත්‍රීන්ද, වයස 55 ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,329 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට හතරක (4%) මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට තුනක (3%) දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඊ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(උ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඌ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(එ) අයදුම්කරුවන්, නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදනම් වී සිටිය යුතුයි.

(ඒ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුයි.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළහැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් සවකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු, නියමිත වැටුප් වැඩවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය, තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය හට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදනම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැල පෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර, ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසුබැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

**————————තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

(අ) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :—

අවුරුදු :————, මාස :————, දින :————.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

**14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :—**

**15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.**

**16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.**

**17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.**

**(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)**

**මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බව ද, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.**

**————,**
**අයදුම්කරුගේ අත්සන.**

**දිනය :————.**

**පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.**
**තැ. පෙ. 530,**
**කොළඹ 1.**

---

## පළාත් පාලන සේවය

### මුරකරු තනතුර—හිඟුරක්ගොඩ සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 540—30×8, 24×1—රු. 804, රු. 636 සහ රු. 732 වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස.—1970.11.1 දිනට වයස අවුරුදු 25 නොඅඩු 45 නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 5 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුතු අතර හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුතුයි.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනිත් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1970 නොවැම්බර් 25 දිනට හෝ ඊට පළමු හිඟුරක්ගොඩ සුළු නගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

දොන් රොබට් අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1970.10.18,
සුළු නගර සභා කාර්යාලය,
හිඟුරක්ගොඩ.

11–174—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### I වෙනි හා II වෙනි ශ්‍රේණියේ ලේකම් තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. **වැටුප.**—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 6,960—180×6—240×8—රු. 9,960. රු. 8,520 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් වේ.

II **ශ්‍රේණියේ වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 6,024—144 × 4—180×8—රු. 8,040. රු. 6,960කට පළමු කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති, පළාත් පාලන සේවා සාමාජිකයන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

4. මෙම ගැසට් පත්‍රයෙහි ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි කෙරෙහි සැළකිල්ල යොමු කරවමි.

5. **පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි** යටතේ ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1970.11.24 දිනට පෙර මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම්පත් හෝ ඊට අදාළ අනෙකුත් ලියකියවිලි එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් භාර ගනු ලබන්නේ ඒවා පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඒවා භාරගන්නා ලෙස ඔවුන් නිර්දේශ කළහොත් පමණි.

ඩ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ඔක්තෝබර් මස 28 දින,
තැ. පෙ. 530,
කොළඹ.

11–155—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### 3 වන ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි තනතුරු

පළාත් පලාන සේවා කොමිෂන් සභාව විසින් යථෝක්ත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප.**—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය : රු. 4,296 144×10—රු. 5,736 (වාර්ෂිකව) වේ. එහි රු. 4,872 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම්**—

(අ) අයදුම්කරුවෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තාහ.

(ආ) අයදුම්කරුවෝ ලාංකික විය යුත්තාහ.

(ඇ) 70.11.24 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ඈ) පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ඔවුනට තිබිය යුතුයි :—

(1) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි (සිවිල්) අවසාන සහතිකය.

(2) නාගරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව).

(3) ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව).

(4) ගොඩනැගිලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව).

(5) උප පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම සඳහා ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ පරිපාලක ඕවර්සියර්වරුන්ගේ දෙපාර්තමේන්තු විභාගය.

(6) සමාන හෝ උසස් විභාගයක්.

ඉහත සඳහන් වැටුප් ක්‍රමය මත පිහිටුවනු ලැබීම සඳහා අයදුම්කරුවන්ට සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ අවුරුදු 3 ක ප්‍රායෝගික පළපුරුද්ද තිබිය යුතුයි.

4. තුන් අවුරුද්දකට අඩු ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ගේ ආරම්භක වැටුප් මෙසේ ය :—

අවුරුදු 2 ක ප්‍රායෝගික පළපුරුද්ද—වර්ෂයකට රු. 4,152.

අවුරුදු 1 ක ප්‍රායෝගික පළපුරුද්ද—වර්ෂයකට රු. 3,864.

ප්‍රායෝගික පළපුරුද්ද නැති අය—වර්ෂයකට රු. 3,720.

5. නියමිත වර්ෂ ගණනක් සේවය කිරීම සඳහා ඇප ඔප්පුවක් හෝ ගිවිසුමක් අත්සන් කොට ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවයේ නියුතු නිළධාරීන් ඉල්ලුම්කර සිටිය යුත්තේ යම්හෙයකින් III වන ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරී තනතුරක් සඳහා තෝරාගනු ලැබුවහොත්, ඇප ඔප්පුවේ හෝ ගිවිසුමේ නියමයන් ඉටුකිරීමට හැකි තත්ත්වයක ඔවුන් සිටියහොත් පමණි.

6. අවශ්‍ය කාර්මික සුදුසුකම් ඇති පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ අයදුම් පත්‍ර, වයස ගැන නියමය නොතකා සලකා බලනු ලැබේ. එබඳු අයගේ අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්ගේ හෝ සභාපතිතුමාගේ මාර්ගයෙනි.

7. අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට, ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ, තුමූම එවැනි අවදානමකට මුහුණ දෙති.

8. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

9. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 70. 11. 24 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

10. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

11. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිළධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

ඩ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

11–154—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## කනංකෙ ගම් සභාව

### කාර්යාල කාර්ය සහායක තනතුර

කනංකෙ ගම් සභාවේ කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා මවිසින් අයදුම් පත් කැඳවනු ලැබේ.

1. **වැටුප් ක්‍රමය.**—රු. 540—30 × 8—24 × 1—රු. 804. රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

2. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අන්තිම දිනට වයස අවුරුදු 20 ට නො අඩු 30 ට නො වැඩි විය යුතුය.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත්විය යුතුය.

(ඇ) අපේක්ෂකයන් කනංකෙ ගම්සභා ප්‍රදේශ සීමාව තුළ නිත්‍ය පදිංචි කරුවන් විය යුතුය.

3. **ඉල්ලුම් පත්‍ර.**—ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකර තිබෙන ආදර්ශ අයදුම් පත්‍රයේ ප්‍රකාර ක්‍රමානුකූලව පැහැදිලිව පිළියෙල කර කනංකෙ ගම්සභාවේ සභාපති තුමා වෙත 1970.11.15 දිනට පෙර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

4. **කොන්දේසි.**—සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයකු වශයෙන් බඳවනු ලැබේ.

ආර්. කේ. ඊ. පියසේන,
කනංකෙ ගම්සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 15 වන දින,
නිමලව, ඉමදූව,
කනංකෙ ගම්සභා කාර්යාලයේ දී ය.

නිවැරදි බවට සහතික කරමි.

ආර්. කේ. ඊ. පියසේන,
කනංකෙ ගම්සභාවේ සභාපති.

11–180—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### මහජන සෞඛ්‍ය පුහුණුවන්නන් උදෙසා අභ්‍යාස පංතිය

මහජන සෞඛ්‍ය පුහුණුවන්නන් උදෙසා වන අභ්‍යාස පංතියට ඇතුළුකර ගැනීම සඳහා පළාත් පාලන සේවයේ සාමාජිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවෝ, මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සිය අයදුම්පත් පිළියෙල කළ යුතුය.

2. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාධක සැපයිය යුතුයි :—

(අ) 70.11.20 දිනට වයස අවුරුදු 35 ට නො වැඩි බවට.

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර පරීක්ෂණයෙන් හෝ සිංහල/දෙමළ සහ අංක ගණිතය හෝ ගණිතය ද සහිතව දෙවරකට නො වැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් හෝ ඊට ඉහළ විභාගයකින් සමත් බවට.

ඉහත සඳහන් සුදුසුකම් ඇතිව පළාත් පාලන සේවයේ නිරත සනීපාරක්ෂක හෝ සෞඛ්‍ය ඕවර්සියර්වරුන් සහ වෙළඳසැල් පරිපාලකවරුන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

3. (අ) අභ්‍යාස පංතිය සඳහා තෝරාගනු ලබන්නාවූ අපේක්ෂකයින් රාජකීය සෞඛ්‍ය සංගමයේ විභාග මණ්ඩලයට රු. 150 ක ගාස්තුවක් ගෙවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතාවයන් සපයා ගත යුතුයි :—

(i) පා පැදියක්.

(ii) කවකටු පෙට්ටියක්.

(iii) මිනුම් පටියක් සහ අඩි කෝදුවක්.

(iv) අපේක්ෂකයින් අභ්‍යාස පන්තියට පැමිණි විට අනෙකුත් අවශ්‍යතාවයන් පිළිබඳව දන්වනු ලැබේ.

(ආ) තෝරාගනු ලබන්නාවූ අයදුම්කරුවන් අවුරුදු 5ක කාලසීමාවක් පළාත් පාලන සේවයෙහි නිරතව සිටීම සඳහා රු. 2,500 ක බැඳුම්කරයකට ඇතුළුවීම අවශ්‍ය වනු ඇත.

(ඇ) අභ්‍යාස පාඨමාලාව මාස දොළහක පමණ කාලයක් සඳහා වනු ඇත.

4. අභ්‍යාස කාලසීමාව සඳහා, තමන් සේවය කරන පළාත් පාලන ආයතනයෙන් සම්පූර්ණ වැටුප් සහිත රාජකාරි නිවාඩු ලබා ගැනීමට පිළිවන් අපේක්ෂකයින්ගේ අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ. මේ බවට නාගරික කොමසාරිස්/සභාපතිතුමාගෙන් ලබාගත් සහතිකයක් අයදුම්පතට ඈමිණිය යුතුය.

5. අභ්‍යාස පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ පසුව, තෝරාගනු ලබන්නාවූ අපේක්ෂකයින්ට පුරප්පාඩු ඇතිවන පරිදි පළාත් පාලන සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු පිරිනමනු ලැබේ. ඔවුන් දිවයිනෙහි කවර පෙදෙසක වුව සේවය කිරීමට සූදානම් විය යුතුය.

6. සියළුම අයදුම්පත්, මෙම දෙපාර්තමේන්තුවේ කවර හෝ නිලධාරි යෙකුගේ පෞද්ගලික ලිපිනයට නොව, කොළඹ, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් නමට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

7. අයදුම්පත් 70.11.20 දිනට පෙර ලැබෙන සේ එවනු මැනවි.

8. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලද බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 ඔක්තෝබර් මස 31 දින,
තැ. පෙ. 530,
කොළඹ.

## ආදර්ශ අයදුම්පත

**මහජන සෞඛ්‍ය පුහුණුවන්නන් උදෙසා වූ පාඨමාලාවට ඇතුළුවීමේ අයදුම්පත**

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය).
(ආ) වයස :— අවුරුදු :——. මාස :——.

4. අධ්‍යාපනික සුදුකම් :—
(සහතික පිටපත් ඇමිණිය යුතුය.)

5. පළාත් පාලන සේවයේ දැනට දරන තනතුර :————.

6. දැනට සේවය කරන පළාත් පාලන ආයතනය :————.

7. පළාත් පාලන සේවයට මුලින්ම පත්වූ දිනය :————.

8. වෙනත් කරුණු :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සඳහන් කරන ලද කරුණු සත්‍ය බවටත්, නිවැරදි බවටත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1. නිර්දේශ කර ඉදිරිපත් කරමි.

2. මෙම අයදුම්කරු මහජන සෞඛ්‍ය පුහුණුවන්නන් සඳහා වන අභ්‍යාස පාඨමාලාවට ඇතුළුවීමට තෝරාගනු ලබන්නේ නම් අභ්‍යාස කාලසීමාව සඳහා ඔහුට සම්පූර්ණ වැටුප් සහිත රාජකාරී නිවාඩු දීමට මෙම පළාත් පාලන ආයතනය මනාපය.

————,
නාගරික කොමසාරිස්/සභාපති,
....................නාගරික/පළාත් ආණ්ඩු/
සුළු නගර/ගම්සභාව.

දිනය :————.

11-226—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී—බී. 67/36

## අකුරැස්ස සුළු නගර සභාව

### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්ති යෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවනු ලැබූ රීතිය.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු ඇමති.

1970 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

### රීතිය

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ පනවා 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබ 1943 අප්‍රේල් මස 9 වැනි දින අංක 9,108 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ රීතියෙන් සංශෝධනය කරන ලද, රීති, ඒවා අකුරැස්ස සුළු නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයට අදළ වන ප්‍රමාණයට එහි අ3 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන අළුත් රීතිය ආදේශ කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

" අ 3 (1) ගාස්තු අයකර තැනැත්තන් ඇතුළු කරනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීම් පැවැත්වීම සඳහා යම් ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් පාවිච්චි කිරීමට බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින ඉල්ලුම්කරුවකු විසින් එකී බලපත්‍රය තමා වෙත නිකුත් කරනු ලැබීමට පෙර පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බලනු ලබන ගාස්තුවක් සභාවට ගෙවිය යුතුය :—

| | එක් දිනකට | | එක් මසකට | | එක් අවුරුද්දකට (දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන) | |
|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන් ගේ ගණන 199 ට වැඩි නොවන කල්හි ... ... | 5 | 0 | 20 | 0 | 100 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන් ගේ ගණන 199 ට වැඩි නමුත් 399 ට වැඩි නොවන කල්හි ... | 10 | 0 | 40 | 0 | 200 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන් ගේ ගණන 399 ට වැඩි කල්හි ... | 15 | 0 | 60 | 0 | 350 | 0 |

11-187—70.11.5 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 21/65.

## දඹුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129(ආ) සහ 152 වැනි වගන්ති යටතේ දඹුල්ල සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

බී. එච්. ද සොයිසා,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
සවදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන අතිරේක ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුලු නගර සභා ආඥාපනතේ 129(ආ) වැනි වගන්තිය යටතේ පනවා අය කරනු ලබන්නාවූද, 1970 පෙබරවාරි 13 වැනි දින අංක 14,893 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති 1970 ජනවාරි 27 වැනි දින දරන දැන්වීමේ සඳහන් වන්නාවූද, 1970 වර්ෂය සඳහාවූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මෙහිවූ උපලේඛනයෙහි සඳහන් ස්ථාන නිදහස් විය යුතුය.

### උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරණ ස්ථාන :—

**කොට්ඨාශ අංක 1**

කන්ඩලම පාර : 20, 30, 32, 34, 36, 40, 50, 60, 60/1, 70, 76, 82, 86, 90, 100, 106, 114, 116, 120, 122, 130, 136, 144, 150, 156, 160, 166, 170, 174, 180, 186, 186/1, 196, 200, 206, 210, 240.

මාතලේ පාර : 83/26, 161, 167, 191, 209, 46, 50, 76, 112, 136/30, 194, 200, 214.

රත්මලගහඇල පාර : 7, 7/1, 15, 25, 12, 24, 40.

**කොට්ඨාශ අංක 2**

කණ්ඩලම පාර : 15, 31, 71, 77, 83, 93, 93, 97, 101, 115, 119, 125, 131, 135, 139, 143, 149, 153, 157, 161, 165, 165/15, 165/25, 165/30, 169, 175, 179, 189, 193, 215, 239.

පාංදෙනිය පාර : 7, 15, 25, 25/1, 25ඒ, 27, 37, 45, 47, 49, 53, 53/1, 55, 57, 57/2, 57/4, 57/10, 57/25, 63, 14, 20, 26, 30, 30/1, 36, 36/1, 40, 40/1, 42, 44, 44/1, 44/4, 46, 46/1, 46/6, 46/7, 48, 52, 54.

පහළවැව පාර : 1, 2, 14.

**කොට්ඨාශ අංක 3**

හලුඅපුල්ලන වැව පාර : 1, 1/1, 1/8, 3, 3ඒ, 5, 5/1, 5/2, 9, 9ඒ, 11, 13, 15,
කුරුණෑගල පාර : 227/16, 227/18, 227/25, 227/32, 245, 259, 275. 301, 478/8, 506ඒ, 508ඒ, 510, 512, 512/1.

නිශ්ශංක මාවත : 3, 3/5, 5, 17/20, 17/25, 17/30, 17/35.

පිරිවෙන පාර : 15/8, 15/9, 15/10, 15/11, 15/24, 25, 59, 63, 77, 101, 16, 26, 28, 42, 44, 52, 54, 56, 58, 60, 66, 68, 78, 100, 100/7.

**කොට්ඨාශ අංක 4**

අනුරාධපුර පාර : 172/7.

කුරුණෑගල පාර : 103, 103/7, 103/12, 107, 121, 121/1, 121/6, 121/18, 129, 129/1, 129/2, 129/3, 129/4, 129/5, 129/6, 129/7, 129/8, 129/9, 129/10, 129/10ඒ, 129/11, 129/12, 129/13, 129/14, 129/15, 129/15ඒ, 129/16, 129/17, 129/18, 129/19, 129/20, 129/21, 129/22, 129/23, 129/24, 129/25, 129/25ඒ, 135, 155, 169, 189, 205, 298, 302, 314, 318, 328, 340, 340ඒ, 342, 348, 358, 362, 366, 376, 400.

**කොට්ඨාශ අංක 5**

අනුරාධපුර පාර : 367, 471, 625, 631, 637, 643, 651, 659, 705, 709, 805, 811, 813, 819, 823, 825, 829, 833, 839, 843, 851, 857, 857/1, 859, 861, 861/1, 869, 875, 674, 680, 690, 700, 718, 720, 730, 736, 738, 742, 748, 760, 766, 774, 784, 786, 792, 800, 806, 812, 820, 820/1, 830, 830/1.

ත්‍රිකුණාමල පාර : 17, 21, 23, 29, 2, 8, 20, 24, 30.

11–175—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී—බී. 81/47

## කොච්චිකඩේ සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) සහ 152 වැනි වගන්ති යටතේ, කොච්චිකඩේ සුළු නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

බී. එච්. ද සොයිසා,
රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ වැඩබලන අතිරේක
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ, 129 (ආ) වැනි වගන්තිය යටතේ, 1970 වර්ෂය සඳහා අය කරනු ලබන්නාවූ කසළ ශෝධන විශේෂ බද්දෙන්, මෙහි වූ උපලේඛනයේ විස්තර කෙරෙන ස්ථානයන් නිදහස් විය යුතුය.

**උපලේඛනය**

පහත සඳහන් වරිපනම් අංක දරන ස්ථානයන් :—

**අංක 1 දරන ඡන්ද කොට්ඨාශය**

පාසැල් පටුමග.—12/3, 12/4, 12/5.

**අංක 3 දරන ඡන්ද කොට්ඨාශය**

පතිමා පාර.—11/12 සහ 29.

**අංක 4 දරන ඡන්ද කොට්ඨාශය**

දූවන පාර.—24, 24/1, 24/2, 24/3, 24/4, 24/5, 24/6, 24/7, 24/8, 24/9, 24/10, 24/11, 24/12, 26, 26/1, 26/2, 26/3, 26/4, 26/5, 26/6, 26/7, 26/8, 26/9, 26/10, 26/11, 26/12.

දූවන පාරෙන් හැරී යන පටු මග.—43 සහ 32.

කොච්චිකඩේ මීගමු පාර.—108/6 සහ 116.

සාන්ත මරියා පාර.—40/2, 40/4, 40/5, 40/7, 40/8, 40/9, 40/10, 40/11, 40/12, 40/13, 40/14, 40/15, 54/1, 64/4, 64/5, 64/7, 64/9, 64/10, 66/1, 66/5, 82/3, 82/4, 82/5, 82/6, 82/7, 82/8, 82/9, 82/11, 82/12 සහ 82/13.

**අංක 5 දරන ඡන්ද කොට්ඨාශය**

දූවන පාර.—43, 43/1 සහ 43/2.

කොච්චිකඩේ මීගමු පාර.—154/11, 154/12, 154/13, 154/14, 154/15, 154/16.

11–188—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 74/48

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බින්තැන්න දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ, ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

බී. එච්. ද සොයිසා,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
අමාත්‍යාංශයේ වැඩ බලන අතිරේක සථිර ලේකම්.

1970.10.20 දින,
කොළඹ දී ය.

**අතුරු ව්‍යවස්ථා**

### ගම්බද වෙළඳ පොළවල්

1. එක් එක් ගම්බද වෙළඳපොලේ සිට සැතපුම් එකක අර්ධ විෂ්කම්භයක් ඇති කවයක් ඇතුළත වූ ප්‍රදේශය එවැනි එක් එක් වෙළඳ පොලේ වෙළඳ ප්‍රදේශය හැටියට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. සභාව විසින් පිහිටුවන ලද යම් ගම්බද වෙළඳපොලක, යම් කඩ කාමරයක්, කඩබක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගන්නා වූ හෝ පාවිච්චි කරන්නාවූ සෑම තැනැත්තෙකු විසින්ම එසේ ප්‍රයෝජනයට ගැනීම හෝ පාවිච්චි කිරීම සඳහා මෙහි වූ උපලේඛනයේ සඳහන් ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් ගෙවිය යුතුය.

### සංචාරක වෙළෙන්දෝ

3. (1) සභාපති විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් පිට මිස, කිසිම තැනැත්තෙකු විසින් සංචාරක වෙළෙන්දෙකුගේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ කරගෙන යාම නොකළ යුතුය.

(2) සභාපති විසින් කලින් අවලංගු නොකරන ලද්දේ නම් (1) වෙනි ඡේදය යටතේ නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර් මාසයේ තිස් එක්වෙනි දිනට අවසන් විය යුතුයි.

(3) මෙම අතුරු ව්‍යවස්ථාවල — "සභාව" යන්නෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ බින්තැන්න දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

උපලේඛනය

| | දිනක ගාස්තු රු. ශ. |
|---|---|
| 1. වෙළඳපොල ගොඩනැගිල්ල තුල සතරැස් අඩි 50 කට වැඩි නොවන කඩ කාමරයක්, කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 2 0 |
| 2. වෙළඳපොල භූමියෙහි කඩ කාමරයක් සඳහා, එවැනි කඩ කාමරයක්— | |
| (අ) සතරැස් අඩි 30 කට වැඩි නොවන විට ... | 1 0 |
| (ආ) සතරැස් අඩි 30 කට වැඩි වන නමුත් සතරැස් අඩි 50 කට වැඩි නොවන විට | 1 25 |
| (ඇ) සතරැස් අඩි 50 කට වැඩි වන නමුත් සතරැස් අඩි 100 කට වැඩි නොවන විට | 1 50 |
| 3. එළිමහන් බිම කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා එවැනි කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක්— | රු. ශ. |
| (අ) සතරැස් අඩි 9 කට වැඩි නොවන විට ... | 0 10 |
| (ආ) සතරැස් අඩි 9 කට වැඩිවන නමුත් සතරැස් අඩි 25 කට වැඩි නොවන විට ... | 0 25 |
| (ඇ) සතරැස් අඩි 25 කට වැඩි වන නමුත් සතරැස් අඩි 50 කට වැඩි නොවන විට ... | 0 50 |
| (ඈ) සතරැස් අඩි 50 කට වැඩිවන නමුත් සතරැස් අඩි 100 කට වැඩි නොවන විට ... | 1 0 |

11–189—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

**මහනුවර දිස්ත්‍රික්කය**

### පාතහේවාහැට ගන්දහය දකුණ අංක 2 ගම් සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 36 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ පාතහේවාහැට ගන්දහය දකුණ අංක 2 ගම්සභාවේ අංක 17 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා අබේසේකර මුදියන්සේලාගේ ජිනානන්ද මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 ඔක්තෝබර මස 26 වැනි දින,
කොළඹ දී ය.

11–224—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66(2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපෙක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 ඔක්තෝබර මස 25 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපෙක්ෂකයාගේ නම |
|---|---|---|
| | | **මහනුවර දිස්ත්‍රික්කය** |
| | | **හාරිස්පත්තු උඩගම්පහ ගම්සභාව** |
| 4 | ... | කජුකොටුවේ ගෙදර අහමඩ් මොහමඩ් මොහමඩ් මුහුසීන් |
| | | **මාතලේ දිස්ත්‍රික්කය** |
| | | **මාතලේ මහ නගර සභාව** |
| 3 | ... | උඩුගම, ඇලෙක්සැන්ඩර් පිචඩ් |
| | | **කොළඹ දිස්ත්‍රික්කය** |
| | | **දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව** |
| 13 | ... | සමරවීර දෙන් විලී |
| | | **කුරුණෑගල දිස්ත්‍රික්කය** |
| | | **ගොකරැල්ල ගම් සභාව** |
| 5 | ... | ජයවර්ධන මුදියන්සේලාගේ මුතු බණ්ඩා |

11–225—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## මුල්ලේරියාව සුළු නගර සභාව

**1969 වර්ෂයේ ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය**

| ආදයම | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම ... ... | 1,16,192 33 | |
| බී.—මංමාවත් ... ... | 287 35 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | — | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 900 0 | |
| ඊ.—මහජන විනෝදය ... ... | 15 0 | |
| එෆ්.—සොහොන් භූමි ... ... | — | |
| ජී.—සූනබ ලියාපදිංචිය ... ... | 1 0 | |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාව ... | — | |
| ජේ.—කියවීම්ශාලා හා පුස්තකාල ... | 600 0 | |
| | | 1,17,995 68 |
| **වෙනත් ලැබීම්** | | |
| 1. තැන්පත් ... ... ... | | 11,498 58 |
| 2. අත්තිකාරම් ... ... ... | | 4,249 24 |
| 3. ආදයම් එකතු ගණන— | | |
| (ඒ) දේපල බදු ... ... ... | | 65,817 14 |
| (බී) වරෙන්තු ගාස්තු ... ... | | 1,291 05 |
| 4. විවිධ ණය හිමියෝ ... ... | | 13,840 19 |
| 5. විවිධ ණය ගැතියෝ ... ... | | 6,784 14 |
| 6. අධිකතා හා ඌණතා ගිණුම ... ... | | 14,952 82 |
| 1968.12.31 වැනි දිනට ඉතිරි මුදල් ... ... | | 16,155 67 |
| | | 2,52,584 51 |

| වියදම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 39,062 89 | |
| බී.—මංමාවත් ... ... | 30,348 95 | |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 3,275 25 | |
| ඩී.—මහජන සෞඛ්‍ය ... ... | 12,818 86 | |
| ඊ.—මහජන විනෝදය ... ... | — | |
| එෆ්.—සොහොන් භූමි ... ... | — | |
| ජී.—සූනබ ලියාපදිංචිය ... ... | — | |
| එච්.—කිරුම් හා මිනුම් ... ... | — | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාව ... | — | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 2,244 33 | |
| | | 87,750 28 |
| **වෙනත් ගෙවීම්** | | |
| 1. තැන්පත් ... ... ... | | 7,829 22 |
| 2. අත්තිකාරම් ... ... ... | | 4,813 65 |
| 3. සභාපති අරමුදල ... ... ... | | 25 0 |
| 4. ආදයම් එකතු ගණන— ... ... | | |
| (ඒ) දේපල බදු ... ... ... | | 60,933 0 |
| (බී) වරෙන්තු ගාස්තු ... ... | | 2,038 15 |
| 5. විවිධ ණය හිමියෝ ... ... | | 6,118 25 |
| 6. විවිධ ණය ගැතියෝ ... ... | | 5,691 11 |
| 7. අධිකතා හා ඌණතා ගිණුම ... ... | | 14,420 10 |
| 1969.12.31 වැනි දිනට ඉතිරි මුදල්... ... | | 62,965 75 |
| | | 2,52,584 51 |

මුල්ලේරියාව සුළු නගර සභාවේ සභාපති තැන්පත් වැඩිනම්බු ආරච්චිගේ දෙන් නෙල්සන් නන්දතිලක වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1969 වර්ෂය තුළ මුල්ලේරියාව සුළු නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳ සත්‍ය වූත්, නිවැරදි වූත්, ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. ඒ. ඩී. නෙල්සන් නන්දතිලක,
මුල්ලේරියාව සුළු නගර සභාවේ සභාපති.

නිවැරදි බවට,

නොයල් ගුණසේකර,
අංක 2 දරණ කොටසේ සභික.

වර්ෂ 1970 ක්වූ පෙබරවාරි මස 26 වැනි දින මුල්ලේරියාවේදී මා ඉදිරිපිටදී සහතික කල බවට,

ජී. රාජපක්ෂ,
සමාදාන විනිශ්වයකාර තැන.

**මුල්ලේරියාව සුළු නගර සභාවේ 1969 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය**

| බැරකම් | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | වත්කම් | රු. ශ |
|---|---|---|---|---|---|---|
| තැන්පත් සාමාන්‍ය ... | | | 3,210 49 | | අත්තිකාරම් ... ... | 2,839 22 |
| වියදම් නොකළ රජයේ ආධාර— | | | | | දේපල බදු හිඟ ... | 68,689 89 |
| මුඩුක්කු සංහාර නිවාස යෝජනා ක්‍රමය ... | | 20,000 0 | | | වරෙන්තු ගාස්තු හිඟ ... | 4,621 10 |
| පොකුණුගොඩ පාර ... ... | | 480 0 | | | විවිධ ණය ගැතියෝ ... | 10,037 74 |
| හිඹුටාන හිනටිකුඹුර පාර ... ... | | 221 50 | | | තැ. ක. ඉ. බැංකුවේ තැන්පත් ... | 250 0 |
| මුල්ලේරියාව උතුර සුසාන භූමියට යන පාර | | 2,036 04 | | | මහජන බැංකුවේ ස්ථාවර තැන්පත් | 20,000 0 |
| මුල්ලේරියාව හිඹුටාන ඇළ | | 319 0 | | | | |
| සැලලිහිණි මාවත ... ... | | 5,626 32 | | | 69.12.31 දිනට ඉතිරි මුදල් ... | 62,965 75 |
| කැළණිමුල්ල ලිඳ සඳහා ... ... | | 1,750 0 | | | | |
| ප්‍රජාමණ්ඩල ... ... | | 89 35 | | | | |
| | | | 30,522 21 | | | |
| | | | | 33,732 70 | | |
| ණය ඉතිරිය ... ... | | | | 60 | | |
| සභාපති අරමුදල ... ... | | | | 80 0 | | |
| විවිධ ණය හිමියෝ ... ... | | | | 13,983 69 | | |
| අධිකතා හා ඌණතා ගිණුම : | | | | | | |
| 69.1.1 ට අධිකය ... ... | | 90,828 59 | | | | |
| 69 වර්ෂයට සැකසීම් : බැර ... ... | 14,952 82 | | | | | |
| එම හර ... ... | 14,420 10 | | | | | |
| | | 532 72 | | | | |
| 69 වර්ෂයට ආදයම ... 1,17,995 68 | | 91,361 31 | | 1,21,606 71 | | |
| 69 වර්ෂයට වියදම ... 87,750 28 | | 30,245 40 | | | | |
| | | | | 1,69,403 70 | | 1,69,403 70 |

මුල්ලේරියාව සුළු නගර සභාවේ සභාපති තැන්පත් වැඩිනම්බු ආරච්චිගේ දෙන් නෙල්සන් නන්දතිලක වන මම මගේ පූර්ණ දැනීමේ හැටියට 1969 දෙසැම්බර් මස 31 වැනි දිනට මුල්ලේරියාව සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ ඉහතින් දැක්වෙන ප්‍රකාශය සත්‍යවූත්, නිවැරදි වූත්, එකක් බව මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. ඒ. ඩී. නෙල්සන් නන්දතිලක,
මුල්ලේරියාව සුළු නගර සභාවේ සභාපති.

නිවැරදි බවට,

නොයල් ගුණසේකර,
අංක 2 දරණ කොටසේ සභික.

වර්ෂ 1970 ක් වූ පෙබරවාරි මස 26 වැනි දින මුල්ලේරියාවේදී මා ඉදිරිපිටදී සහතික කල බවට,

ජී. රාජපක්ෂ,
සමාදාන විනිශ්වයකාර තැන.

11–150/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## හැඳල සුලු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (ii) යටතේ ඉල්ලීම—1970 අය වැය ලේඛනය

1970 වර්ෂයේ අය වැය ලේඛණයේ මුදල් ඉතිරි වේ යයි ගණන් බලන ලද වැය ශීර්ෂයන්ගෙන්, වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි දක්වෙන පරිදි, මුදල් මාරු කිරීමට 1970.9.27 දින පවත්වන ලද, හැඳල සුළු නගර සභා මාසික රැස්වීමේ අංක 9(අ) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| ඉතිරි වේ යයි ගණන් බලන ලද මුදල් සහ වැය ශීර්ෂ | රු. ශ. | වැඩිපුර අවශ්‍ය වේයයි ගණන් බලන ලද මුදල් සහ වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|---|---|
| ඒ—2. (සී) බදු එකතු කරන්නන්ට කොමිස් ... ... | 800 0 | 2.2 (ඇම්) අතිකාල දීමනා ... ... | 800 0 |
| | 800 0 | | 800 0 |

ඒ. ඩී. විල්බට්,
සභාපති,
හැඳල සුලු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 10 වැනි දින,
හැඳල සුළු නගර සභා කායඝාලයේදීය.

අනුමත කරමි.

ඔලිවර් ගුරුසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්(කොදි).

1970 ඔක්තොබර් මස 21 වැනි දින,
බම්බලපිටියේදිය.

11–168—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## අම්බලන්ගොඩ නගර සභාව

මුදල් රෙගුලාසි අංක 12(II) යටතේ කෙරෙන අයදුම් පත්‍රයි.

1970 අයවැය ලේඛනය

1970 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරි වේයැයි ගණන් බලන ලද පහත සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1970 අගෝස්තු මස 30 වැනි දින අංක 13 දරණ සභා තීරණයෙන් සභා සම්මත විය.

| ශේෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ—5. පාසැල් පොත් සැපයීම ... ... | 1,000 | 0 |
| බී—2. නඩත්තුව ...... ... ... | 10,000 | 0 |
| බී—7. ඉඩම් ලබා ගැනීම ... ... | 10,000 | 0 |
| බී—8. සංවර්ධනය ... ... ... | 15,000 | 0 |
| බී—12. අළුත් වැඩ ... ... ... | 3,000 | 0 |
| සී—3. ගෘහ භාණ්ඩ හා උපකරණ ... ... | 1,000 | 0 |
| සී—4. සංවර්ධනය ... ... ... | 2,500 | 0 |
| ඩී—5. ද්‍රව භාණ්ඩ ... ... ... | 2,500 | 0 |
| ඊ—1. (ජී) වතුර බැස්වීමේ කානු ... ... | 5,000 | 0 |
| ඊ—1. (එම්) මාතෘ නිවාසය හා දරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 1,000 | 0 |
| ඊ—3. (ජී) ගොඩනැගිලි තැනීම ... ... | 1,000 | 0 |
| ඊ—5. (සී) නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| ඊ—5. (එච්) ප්‍රසිද්ධ නාන ස්ථාන ... ... | 1,000 | 0 |
| එජ්—6. ඉදි කිරීම ... ... ... | 2,183 | 0 |
| ජී—3. ඉදි කිරීම ... ... ... | 2,000 | 0 |
| එකතුව ... | 58,188 | 0 |

| අතිරික්ත | රු. | ශ. |
|---|---|---|
| ඒ—2. (ඇජ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, මුද්දර, ප්‍රචාරය හා කාර්‍යාලීය වියදම් ... ... ... ... | 5,000 | 0 |
| බී—1. (බී) ඕවර්සියර් ... ... | 1,250 | 0 |
| ඩී—7. අළුත් වැඩ ... ... ... | 40,000 | 0 |
| ඊ—5. (ඩී) ඉඩම් ලබා ගැනීම ... ... | 238 | 0 |
| ජී—2. නඩත්තුව ... ... ... | 1,700 | 0 |
| ජේ—2(ඩී) ධාවන කම්බි නඩත්තුව ... ... | 5,000 | 0 |
| ජේ—6. දියුණු කිරීම හා දිර්ඝ කිරීම ... ... | 5,000 | 0 |
| එකතුව ... | 58,188 | 0 |

ඇස්. ඒ. සිලවතී ද සිල්වා,
සභාපතිනිය,
නගර සභාව, අම්බලන්ගොඩ.

1970 ඔක්තෝබර් මස 26 වැනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.

11-164—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## වැලිගම නගර සභාව

1970 වර්ෂයේ දෙවැනි පරිපූරක අය වැය ලේඛනය

| වැය ශීර්ෂය හා උප ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් ... ... ... | 25 | 0 |
| ඒ.—(2) (ඇජ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ වැඩ ආදිය ... | 2,000 | 0 |
| ඊ.—(1) (ඇල්) මාතෘ දරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 3,100 | 0 |
| ඊ.—(3) (සී) උපකරණ ... ... ... | 750 | 0 |
| ඊ.—(5) (ඒ) වේතන ... ... ... | 175 | 0 |
| ජේ.—(1) (ඇජ්) විවාහක දීමනා ... ... | 40 | 0 |
| ජේ.—(4) (බී) බාහිර නිලධාරීන්ගේ වැටුප් ... ... | 1,600 | 0 |
| ජේ.—(4) (සී) මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය ... ... | 200 | 0 |
| ජේ.—(4) (ඊ) ජීවනාධාර ... ... ... | 300 | 0 |
| ජේ.—(6) ව්‍යාප්ත කිරීම ... ... ... | 2,500 | 0 |
| එකතුව ... | 10,690 | 0 |

මෙය 1970 ඔක්තෝබර් මස 24 වෙනි දින පවත්වන ලද සාමාන්‍ය රැස්වීමේදී පිළිගන්නා ලදී.

හෙන්රි දළුවත්ත,
සභාපති,
නගර සභාව, වැලිගම.

1970 ඔක්තෝබර් මස 16 වැනි දින,
වැලිගම නගර සභා කාර්‍යාලයේ දීය.

11-170—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## මාදම්පේ සුළු නගර සභාව

පළමුවැනි පරිපූරක අය වැය ලේඛනය—1970

සාමාන්‍ය අංශය

| වියදම් ශීර්ෂය | ගණන් බලන ලද වියදම රු. | ශ. |
|---|---|---|
| ඩී.—7 (බී) නඩත්තුව ... ... ... | 570 | 0 |
| ඩී.—7 (අයි) කඩවලට බදු මුදල් ගෙවීම ... ... | 180 | 0 |
| එකතුව ... | 750 | 0 |

1970 මාර්තු මස 28 වැනි දින පැවැත්වූ මාසික රැස්වීමේදී, පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයට යටත්ව සභාව විසින් අංක 3 (5) දරණ යෝජනාවෙන් පිළිගනිමින් සම්මත කරන ලදී.

සේගුපති සේගු ඉබ්‍රාහිම්,
සභාපති,
මාදම්පේ සුළු නගර සභාව.

1970 ක්වූ ජූලි මස 15 වැනි දින,
මාදම්පේ සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

අනුමත කරන ලදී.

ඇල්. ජී. ඊ. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
(හලාවත-පුත්තලම.)

1970 ක්වූ ඔක්තෝබර් මස 23 වැනි දින,
හලාවත දී ය.

11-210—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## වෙන්නප්පුව සුළු නගර සභාව

### ඉතිරි වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මුදල් මාරු කිරීම

වර්ෂ 1970 වේ අය වැය ලේඛනයේ මුදල් ඉතිරිවේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත දක්වා ඇති පරිදි මුදල් මාරුකිරීමට 1970.9.27 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත කර ගන්නා ලදී.

සාමාන්‍ය

ඉතිරිමුදල—වැය ශීර්ෂ

| | රු. | ශ. |
|---|---|---|
| ඒ. 2 ඒ දීමනා ... ... ... | 100 | 0 |
| බී. 1. බී වැටුප් කර්මාන්ත ඕවර්සියර් ... ... | 128 | 12 |
| බී. 2 නඩත්තු කිරීම ... ... ... | 900 | 0 |
| ඞී. 2 (ජී) විවාහක දීමනා ... ... ... | 120 | 0 |
| | 1,248 | 12 |

වැඩිපුර වියදම්—වැය ශීර්ෂ

| | රු. | ශ. |
|---|---|---|
| ඒ. 2. බී ගමන් ගාස්තු ... ... ... | 100 | 0 |
| ඒ. 2. ඞී තක්සේරුකරන්නන්ගේ ගාස්තු ... | 900 | 0 |
| ඒ. 2. එච්. ගණන් පරීක්ෂක ගාස්තු ... ... | 8 | 12 |
| ඒ. 2. ජේ. හදිසි වියදම් ... ... ... | 120 | 0 |
| ඞී. 2 (බී) ගොන් කරත්ත, ලොරි ... ... | 120 | 0 |
| | 1,248 | 12 |

2 වැනි කොටස විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී. 3 (බී) කුලී ... ... ... | 50 | 0 |
| ඊඩී. 6 දිර්ඝ කිරීම හා දියුණු කිරීම ... ... | 150 | 0 |
| | 200 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී. 2 (සී) මාපකයන්ත්‍ර ඇණ හා අනිත් උපකරණ ... | 200 | 0 |
| | 200 | 0 |

1970ක්වූ ඔක්තෝබර් මස 15 වන දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්යාලයේදීයැ.

සිඩනි. ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

අනුමත කරමි.

1970.10.26 දින,
හලාවත පළාත් පාලන කාර්‍යාලයේදීය.

එල්. ජී. ඊ. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
පුත්තලම.

11—177—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## වත්තල–මාබෝලෙ නගර සභාව

### මුදල් රෙගුලාසි 12(ii) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### 1970 අය–වැය ලේඛනය

1970 අය–වැය ලේඛනයේ පහත දක්වෙන වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේයැයි ගණන් බලන ලද මුදල ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර, අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට 1970 ඔක්තෝබර් මස 9 වෙනි දින අංක 22 දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

ඉතිරිවේයැයි ගණන් බලන ලද වැය ශීර්ෂයන් හා මුදල්

| | රු. ශ. | | රු. ශ. | |
|---|---|---|---|---|
| බී.—මංමාවත් | | | | |
| 2 නඩත්තුකිරීම ... ... | 5,000 | 0 | | |
| ජේ—විදුලිබල කාර්‍යාංශය | | | | |
| (4) පාලන හා සාමාන්‍ය වියදම් | | | | |
| (ඒ) පරිපාලන ආදීන්ගේ වේතන ... | 300 | 0 | | |
| | | | 5,300 | 0 |
| බී—මංමාව ත් | | | | |
| 12 අළුත්වැඩ ... ... | 9,000 | 0 | | |
| | | | 9,000 | 0 |

අතිරේක වැය අවශ්‍යවී ඇති ශීර්ෂයන් හා මුදල්

| | රු. ශ. | | රු. ශ. | |
|---|---|---|---|---|
| ඒ—සාමාන්‍යවියදම් | | | | |
| (1) නිලධාරි මණ්ඩලයේ වැටුප් | | | | |
| (ඊ) විශ්‍රාම වැටුප් ... ... | 1,700 | 0 | | |
| ඞී—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | | | | |
| (4) නඩත්තු කිරීම ... ... | 600 | 0 | | |
| ඊ—සනීපාරක්ෂාව | | | | |
| (2) කසළ ශෝධනය ... | | | | |
| (සී) ගබඩා ... ... | 3,000 | 0 | | |
| | | | 5,300 | 0 |
| ඊ—සනීපාරක්ෂාව | | | | |
| (2) කසළ ශෝධනය | | | | |
| (ඇෆ්) ගෙවල්කුලී හා අතිකාල දීමනා | 300 | 0 | | |
| ඊ—සනීපාරක්ෂාව | | | | |
| (3) වැසිකිළි පවිත්‍ර කිරීම | | | | |
| (සී) ගබඩා ... ... | 3,000 | 0 | | |
| ඊ—සනීපාරක්ෂාව | | | | |
| (3) වැසිකිළි පවිත්‍ර කිරීම | | | | |
| (අයි) අතිකාලදීමනා ... ... | 400 | 0 | | |
| ඊ—සනීපාරක්ෂාව | | | | |
| (6) ආරෝග්‍යශාලා | | | | |
| (ඒ) වේතන ... ... | 1,000 | 0 | | |
| ඊ—සනීපාරක්ෂාව | | | | |
| (6) ආරෝග්‍යශාලා | | | | |
| (බී) නඩත්තුව හා බෙහෙත් ද්‍රව්‍ය ... | 4,000 | 0 | | |
| එච්—බල්ලන් ලියා පදිංචි කිරීම | | | | |
| (1) බල්ලන් විනාශ කිරීම ... | 300 | 0 | | |
| | | | 9,000 | 0 |

| ඉතිරිවේයයි ගණන් බලන ලද වැය ශීර්ෂයන් හා මුදල් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| බි—මංමාවත් | | |
| 12 අළුත්වැඩ ... ... | 3,000 0 | |
| ඩි—නගරසභා ගොඩනැගිලි හා ඉඩම් | | |
| 7 අළුත් කර්මාන්ත ... ... | 20,000 0 | |
| ඊ—සනීපරක්ෂාව | | |
| 7 වෙළඳපොළවල් | | |
| (ඩී) ඉදි කිරීම් ... ... | 9,000 0 | |
| | | 32,000 0 |
| ඊ—සනීපාරක්ෂාව | | |
| 7 වෙළඳ පොළවල් | | |
| (ඇ[ජ) සතුකොට ගැනීම ... | 10,000 0 | |
| | | 10,000 0 |
| ජේ—විදුලිබල කායඹාංශය | | |
| (4) පාලන හා සාමාන්‍ය වියදම් | | |
| (ඒ) පරිපාලන ආදීන්ගේ වේතන ... | 3,000 0 | |
| ඩී—නගර සභා ගොඩනැගිලි හා ඉඩම් | | |
| (5) ලී බඩු ... ... | 1,500 0 | |
| ඊ—සනීපාරක්ෂාව | | |
| (5) ජලසම්පාදනය ... ... | 11,000 0 | |
| (එච්) නාන ස්ථානය | | |
| ඊ—සනීපාරක්ෂාව | | |
| 7 වෙළඳ පොළවල් | | |
| (ඇ[ජ) සතුකොට ගැනීම්... ... | 4,500 0 | |
| | | 20,000 0 |
| | | 76,300 0 |

| අතිරේක වැය අවශ්‍යවී ඇති ශීර්ෂයන් හා මුදල් | රු. ශ. |
|---|---|
| ජේ—විදුලි බල කායඹාංශය | |
| (1) විදුලි බල උත්පාදනය | |
| (ඩී) විදුලි බලය ලබාගැනීම ... | 32,000 0 |
| ජේ—විදුලි බල කායඹාංශය | |
| (3) සේවය හා නිවාසයන්ට කම්බි | |
| (ඒ) උපකරණ ... | 10,000 0 |
| ඊ—සනීපාරක්ෂාව | |
| (2) කසළ ශෝධනය | |
| (ඒ) වේතන ... ... | 20,000 0 |
| | 76,300 0 |

1970 ඔක්තෝබර් මස 23 වැනි දින,
වත්තල-මාබෝලේ නගර සභා කාර්යාලයේදීය

පී. ආර්. පර්සි ඩයස්,
සභාපති,
වත්තල-මාබෝලෙ නගර සභාව.

11—205—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (ii) යටතේ ඉල්ලුම් පත්‍රය

### 1970 අය වැය ලේඛනය

1970 සැප්තැම්බර් මස 23 වැනි දින මාසික රැස්වීමේ අංක 2(ii) දරන යෝජනාව යටතේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමතියට යටත්ව සම්මත කර ගන්නා ලද පහත සඳහන් වැඩිපුර වැය ශීර්ෂයන් පිරවීම සඳහා වෙනත් ඉතිරි වැය ශීර්ෂයන් :—

| ඉතිරිය | රු. ශ. | වැඩිපුර | රු. ශ. |
|---|---|---|---|
| බි—7. ඉඩම් අත්පත් කර ගැනීම ... ... | 1,000 0 | බී—14. බස් නැවතුම්පල හා බස් නවත්වන ස්ථානය ... | 4,000 0 |
| බි—12. අලුත් වැඩ ... ... ... | 3,000 0 | ඩී—7. (බී) නඩත්තුව ... ... ... | 500 0 |
| ඊ—5. දැයක මිළ හා ආධාර ... ... | 500 0 | ඒ— 12. (බී) ගමන් ගාස්තු ... ... | 750 0 |
| ඩී—5. (බී) ගබඩා ... ... ... | 750 0 | | |
| එකතුව | 5,250 0 | එකතුව | 5,250 0 |

සුලු නගර සභා කාර්යාලය,
මොණරාගල,
70.10.12

ඊ. විලී ආරියපාල,
සභාපති,
මොණරාගල සුලු නගර සභාව.

අනුමත කරමි.

1970 ඔක්තෝබර් මස 23 වැනි දින,
මොණරාගල පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයය.

එච්. ජී. ආනන්ද,
මොණරාගල පළාත් පාලන සහකාර කොමසාරිස්.

11-204—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## මහරගම උප නගර සභාව

### 1971 වර්ෂය සඳහා සුනඛ බද්ද

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත

මහරගම උප නගර සභා ප්‍රදේශය ඇතුලත ඇති කරන සෑම බල්ලෙකුටම රුපියල් එකක (1.00) හා සෑම බැල්ලකටම රුපියල් එකයි සත පනහක (1.50) ලියාපදිංචි බද්දක් 1971 වර්ෂය සඳහා අය කිරීමට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි පරිච්ඡේදය) 4 වෙනි ඡේදය යටතේ, මහරගම උප නගර සභාව විසින් පනවා ඇති බවත්, එම බද්ද 1971 මාර්තු මස 31 වෙනි දිනට පෙර ගෙවිය හැකි බවත්, මහරගම නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම උප නගර සභාව.

1970 ඔක්තෝබර් මස 23 දින,
මහරගම උප නගර සභා කාර්යාලයේදීය.

11-211/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## මහරගම උප නගර සභාව

**1971 වර්ෂය සඳහා රථවාහන හා සත්ව බද්ද**

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි පරිච්ඡේදය) අංක 161 දරණ ඡේදය යටතේ පහත සඳහන් උප ලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1971 වර්ෂයට රථවාහන හා සත්ව බද්දක් පනවා අයකිරීමටද,

(2) එම ආඥාපනතේ අංක 162 (3) යටතේ, එකී බදු 1971 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය හැකි බවද, මහරගම උප නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම උප නගර සභාව.

1970 ඔක්තෝබර් මස 23 දින,
මහරගම් උප නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| සෑම පාපැදියක්, රෝද තුනේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් රෝද තුනේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (1) වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් (ම. න. වෙ. බ. අකුරු සහිත නිල් පාට තහඩුව) ... ... | 3 | 0 |
| (2) වෙළඳ කටයුතු හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් (ම. න. බ. අකුරු සහිත කහපාට තහඩුව) ... ... | 1 | 0 |
| සෑම කරත්තයක් සඳහා (ම. න. අ. ක. අකුරු සහිත රතු පාට තහඩුව) ... ... | 1 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා (ම. න. බ. බා අකුරු සහිත දම්පාට තහඩුව) ... | 2 | 0 |
| ගොන් දෙන්නා බැඳි බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා (ම. න. බ. ක. අකුරු සහිත කොළ පාට තහඩුව) ... ... ... | 3 | 0 |

11–211/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## යටියන්තොට සුළු නගර සභාව

**1971 වර්ෂය සඳහා වූ දේපල බද්ද**

**සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත යටතේ ගතවී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් බදු, 1971 වර්ෂයටද එලෙසම පැනවීමට යටියන්තොට සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159(2) වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතක බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දායින් අවසන්වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

කේ. වින්සන්ට් පෙරේරා,
සභාපති,
යටියන්තොට සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 25 දින,
යටියන්තොට,
සුළු නගර සභා කාර්යාලයේදීය.

11–192/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## යටියන්තොට සුළු නගර සභාව

**1971 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

**සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)**

යටියන්තොට සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) අංක 161 දරණ වගන්තිය යටතේ පහත දක්වෙන උපලේඛනයෙන් විස්තර වෙන ගණන් අනුව 1971 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) දරන වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින් ද වේ.

කේ. වින්සන්ට් පෙරේරා,
සභාපති,
යටියන්තොට සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 25 දින,
යටියන්තොට,
සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් සයිකල් කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි, හැර වෙන යම් ඕනෑම වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියකට හෝ රෝදත්‍රයේ පාපැදියකට හෝ පාපැදිකාරයකට හෝ කරත්තයකට හෝ රෝදත්‍රයේ පාපැදි කාරයකට හෝ කරත්තයකට— | | |
| (අ) වෙළඳ කාර්යයක් සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 3 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කෙරේ නම් ... | 1 | 0 |
| සෑම ගොන් බඳින කරත්තයක් සඳහා ... | 4 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 | 0 |

11–192/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## යටියන්තොට සුළු නගර සභාව

**1971 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 අධිකාරය)**

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර යටියන්තොට සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලකු වෙනුවෙන් රුපියල් 1 ක්ද, බැල්ලියක වෙනුවෙන් රුපියල් 1.50 ක්ද, ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1971 වර්ෂයට පනවා ඇති බවද, එකී ගාස්තු 1971 වර්ෂයේ මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. වින්සන්ට් පෙරේරා,
සභාපති,
යටියන්තොට සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 25 දින,
යටියන්තොට,
සුළු නගර සභා කාර්යාලයේදීය.

11–192/3—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි 8 වැනි දින අංක 14,703 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දා වූ ද උභය මන්ත්‍රී මණ්ඩලය මගින් අනුමත කරණ ලද බව 1969 ජනවාරි 3 වැනි දින අංක 14,835 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දා වූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 39, 40 සහ 41 වැනි කාණ්ඩයන් මෙම යෝජනාව ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැණීමට කොබෙයිගනේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ජේ. එම්. මුදියන්සේ,
සභාපති.
කොබෙයිගනේ ගම්සභාව.

1970 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින,
කොබෙයිගනේ ගම්සභා කාර්යාලයේ දී ය.

11–191—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## වැල්ලව ගම්සභා ප්‍රදේශය—කුරුණෑගල දිස්ත්‍රික්කය

**මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අයවළුන් විසින් එහි දක්වෙන ස්ථානවල 1971 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිත ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටින සේ සකස්කොට මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවුන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඒ. ඇම්. ඇම්. බුහාරි මයා., අංක 18/4, මල්ලවපිටිය, කුරුණෑගල ... | ගව මස් ... | අංක 15/4, නුවර පාර, මල්ලවපිටිය, කුරුණෑගල |
| 2. | යූ. ඇල්. ඇම්. සහීදු මයා., අංක 17/2, මල්ලවපිටිය, කුරුණෑගල ... | ගව මස් ... | අංක 17/2, නුවරපාර, මල්ලවපිටිය, කුරුණෑගල |
| 3. | ඇම්. සී. ඇම්. මීරා සහිබ් මයා., අංක 5/4, මල්ලවපිටිය, කුරුණෑගල ... | ගව මස් ... | දීවල නැමැති ඉඩම, දඹුළුපාර, යග්ගේපිටිය, කුරුණෑගල |
| 4. | කේ. නුහු ලෙබ්බෙ මයා., අංක 21/6 ඒ, තෙලියාගොන්න, කුරුණෑගල ... | ගව මස් ... | වැල්ලව වෙළඳ පොලේ පිහිටි මස් කඩය |
| 5. | ඇස්. ඇල්. මොහමඩ් මයා., නො. 34, පුත්තලම් පාර, කුරුණෑගල ... | ගව මස් ... | කුඩාගල්වැටියවත්ත නැමැති ඉඩම, දඹුළු පාර, යතෝරයා |

ගම්සභාකායර්‍යාලය, මරළුවාව, කුරුණෑගල,
1970 ඔක්තෝබර් 20 දින දීය.

ඩී. පී. දවිත්,
වැල්ලව ගම්සභාවේ සභාපති තැන.

11–193—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## පානදුර නගර සභාව

**1971 වර්ෂය සඳහා වාහන හා සත්ව බදු**

### නගර සභා ආඥපනත (255 වෙනි පරිච්ඡේදය)

නගර සභා ආඥපනතේ 255 වැනි පරිච්ඡේදයේ 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය අනුව 1971 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බදු පනවා ඇති බවද, එම පනතේ 166(3) වෙනි වගන්තිය යටතේ එම බදු 1971 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් නිවේදනය කරමි.

### උපලේඛනය

**සතුන්ගේ හා වාහනවල විස්තර**

| | | රු. | ශ. |
|---|---|---|---|
| (1) | සෑම වාහනයකටම (මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් හෝ ට්‍රයිසිකල් නොවන) ... | 4 | 0 |
| (2) | සෑම බයිසිකලයකටම, ට්‍රයිසිකලයකටම, බයිසිකල් කාර් හෝ කරත්තයකටම, ට්‍රයිසිකල් කාර් හෝ කරත්තයකටම ... ... | 1 | 0 |
| (3) | වෙළඳ කටයුතු සඳහා පාවිච්චිකරන බයිසිකලයකටම | 5 | 0 |
| (4) | සෑම කරත්තයකටම ... ... | 2 | 0 |
| (5) | සෑම අත් කරත්තයකටම ... ... | 1 | 0 |
| (6) | සෑම ජින් රික්ෂෝවකටම ... ... | 2 | 0 |
| (7) | සෑම අශ්වයෙකුටම හෝ කොටළුවෙකුටම ... | 5 | 0 |

වයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

1970 ඔක්තෝබර් මස 26 වැනිදා,
පානදුර, නගර සභා කාර්යාලයේ දී.

11–151/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## පානදුර නගර සභාව

**1971 වර්ෂය සඳහා බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥපනතේ (477 පරිච්ඡේදය) 4 වන වගන්තිය යටතේ පානදුර නගර සභාවේ පාලන සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුටම රු. 2.50ක් ද සෑම බැල්ලකටම රු. 5ක් ද, 1971 වර්ෂය සඳහා බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් නියම කර ඇති බව හා 1971 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර එම ගාස්තු ගෙවිය යුතු බවත් මෙයින් නියවේදනය කරමි.

වයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

1970 ඔක්තෝබර් මස 26 වැනිදා,
පානදුර, නගර සභා කර්යාලයේ දී.

11–151/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## වෙන්නප්පුව සුළු නගර සභාව

**1971 වර්ෂයට දේපල බද්ද**

සුළු නගර සභා ආඥපනත (256 වැනි අධිකාරය) යටතේ ගතව යන 1970 වැනි වර්ෂයට බලපවත්වන පහත සඳහන් දේපල බද්ද 1971 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට වෙන්නප්පුව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවලට වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදයින්, ජූනි 30 වැනිදයින්, සැප්තැම්බර් 30 වැනිදයින් හා දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්යාලයේදීය.

11–149/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

**1971 අවුරුද්ද සඳහා රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද**

### 256 වන අධිකාරිය වන සුළු නගර සභා ආඥපනත

වෙන්නප්පුව සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වන අධිකාරිය වන සුළු නගර සභා ආඥපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1971 අවුරුද්දට රථවාහන සහ සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද ;

(2) එකී ව්‍යවස්ථාවේ අංක 162 (3) යටතේ එකී බදු, 1971 මාර්තු මස 31 වැනිදට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්යාලයේදීය.

**උපලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේනම් ... | 2 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බඳින සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බඳින සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 2 | 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම අශ්වයෙකුට, අශ්වතරයෙකුට හෝ පෝනියෙකුට ... | 2 | 50 |
| සෑම ගොනෙකුට හෝ බූරුවෙකුට ... ... | 0 | 50 |

11–149/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

**1971 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනත (334 වෙනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනතේ (334 වෙනි පරිච්ඡේදය) 4 වෙනි වගන්තිය ප්‍රකාර වෙන්නප්පුව සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙක් හෝ බැල්ලියක් සඳහා ශත 50 බැගින් 1971 මාර්තු 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පනවා අය කිරීමට තත් සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
වෙන්නප්පුව සුළු නගර සභා කාර්යාලයේදීය.

11–149/3—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගර සභාව

**නගර සභා ආඥපනත**

### 1971 වර්ෂය සඳහා දේපල වරිපනම් බද්ද

(255 වන අධිකාරය වන) නගර සභා ආඥපනතේ 160 වන වගන්තිය යටතේ ගතවී ගිය 1970 වර්ෂයට බලපවත්වන ලද දේපළ බදු 1971 වර්ෂයට ද එලෙසම පැනවීමට මාතර නගර සභාව තීරණය කර ඇත.

එම තීරණය ප්‍රකාර, මෙම නගර සභා සීමාව තුළ පිහිටි කුඹුරු හැර සෙසු සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට විස්ස බැගින් වූ දේපල වරිපනම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන පරිදි මාතර නගර සභාව විසින් 1971 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. කේ. පියදාස,
සභාපති.

1970 ඔක්තෝබර් මස 23 දා,
මාතර, නගර සභා කාර්යාලයේ දී ය.

11-208/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## මාතර පළාත් ආණ්ඩු සභාව

**රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද—1971**

පළාත් ආණ්ඩු සභා ආඥපනතේ 255 වැනි අධිකාරය අංක 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ නම් කරන ලද රථ වාහන ඉදිරියෙන් සඳහන් කර තිබෙන ගාස්තු (පසුගිය වර්ෂයේ මෙන්ම) 1971 වර්ෂයට ද මාතර පළාත් ආණ්ඩු සභා සීමාව තුළ පනවා ඇති බවත්, එකී ආඥපනතේ 163 (3) වගන්තිය ප්‍රකාර එම ගාස්තු 1971 මාර්තු 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්; ට්‍රයි කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින්රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර වෙන ඕනෑම රථයකට | 2 | 50 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට— | | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... ... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... ... | 3 | 0 |
| ඕනෑම අන්දමක තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... ... | 2 | 50 |
| ඕනෑම අන්දමක අත් කරත්තයක් වෙනුවෙන් ... | 1 | 0 |

එස්. කේ. පියදාස,
සභාපති,
මාතර නගර සභාව.

1970 ඔක්තෝබර් මස 20 වැනි දින,
මාතර පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දී ය.

11–208/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## මාතර පළාත් ආණ්ඩු සභාව

### සුනඛයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු—1971

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදයේ) 4 වෙනි කොටසේ ප්‍රකාර මාතර පළාත් ආණ්ඩු සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුට රු. 2.50 ක් හා සෑම බැල්ලකටම රු. 5 ක් බැගින් 1971 මාර්තු මස 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. කේ. පියදාස,
සභාපති,
මාතර නගර සභාව.

1970 ඔක්තෝබර් මස 20 වැනි දින,
මාතර පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දී ය.

11–208/3—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ ප්‍රාදේශීය බල මණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත

ප්‍රාදේශීය බල මණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පා. දූ. උඩගම්පහ දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

ප්‍රාදේශීය බල මණ්ඩල ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පා. දූ. උඩගම්පහ දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් මෙම යෝජනාව රජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි සම්මත කරගනු ලැබේ.

පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරන රජයේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරනු ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 වැනි කාණ්ඩයේ සිට 37 වැනි කාණ්ඩය දක්වාවූද,

1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

1966 ජූලි මස 8 වෙනි දින අංක 14,703 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරනු ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 39 සිට 41 දක්වා කාණ්ඩද මෙම යෝජනාව රජයේ ගැසට් පත්‍රයේ පළකරවන දිනයේ සිට වලංගුවන පරිදි සම්මත කර ගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ පා. දූ. උඩගම්පහ දකුණ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් ප්‍රාදේශීය බලමණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ටී. බී. සමරතුංග,
සභාපති,
පා. දූ. උඩගම්පහ දකුණ ගම්සභාව.

1970.10.24 වෙනි දින,
පිලවල, ගුන්නැපාන.

11–194—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ බලල්ල ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1971 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන බලල්ල ගම් ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 7 (2) (ආ) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳම |
|---|---|---|---|
| 1 | ... ඇම්. හමීඩ් | ... දලදගම | ... හරක් මස් |
| 2 | ... ඇම්. හමීඩ් | ... නාගොල්ලාගම | ... හරක් මස් |

ඩබ්ලිව්. ඇම්. හේරත්බන්ඩා,
සභාපති තැන,
බලල්ල ගම් සභාව.

බලල්ල ගම් සභා කාර්යාලය,
බලල්ල,
1970 ඔක්තෝබර් මස 23 වැනි දින.

11–195—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## ජාඇල නගර සභාව

### 1971 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බදු

### නගර සභා ආඥාපනත (255 වෙනි අධිකාරය)

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 162 (1) (ඒ) වගන්තිය යටතේ 1970 වර්ෂයට පනවා ඇති බදුම 1971 වර්ෂයටද එලෙසම පනවා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාර අය කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නගර සභා ආඥාපනතේ (255 වෙනි අධිකාරය) 163 (3) වගන්තිය අනුව, මෙම බදු 1971 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර හෝ මෙම කාර්යාලයට ගෙවිය යුතු බවද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| (1) මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් ... ... | 5 | 0 |
| (2) බයිසිකලයක් රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් රථයක් හෝ කරත්තයක් හෝ රෝද තුනේ බයිසිකල් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දෙයකට යොදනු ලැබේ නම් ... ... | 1 | 0 |
| (3) ගොන් දෙන්නා බැඳි කරත්තයක් හෝ තිරික් කලයක් ... ... | 3 | 0 |
| (4) තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික් කලයක් ... ... | 2 | 0 |
| (5) අත් කරත්තයක් ... ... | 2 | 0 |
| (6) ජින් රික්ෂෝ රථයක් ... ... | 2 | 50 |
| (7) අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් ... | 5 | 0 |

ඇම්. ජෝශප් මයිකල් පෙරේරා,
ජාඇල නගර සභාවේ සභාපති.

1970.10.19 වැනිදා,
ජාඇල නගර සභා කාර්යාලයේ දීය.

11–178—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## වැල්ලවාය ගම්සභාව

**ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)**

මෙහි පහත සඳහන් උප ලේඛණයෙහි නම් සඳහන්කොට ඇති ස්ථානයේ 1971 වර්ෂයට මස් විකිණීම සඳහා මස්කඩයක් පවත්වාගෙන යැමට බල පත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන වැල්ලවාය ගම්සභා සීමාව තුල පදිංචි යම්කෙනෙක් විරුද්ධවන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින දහහතරක් ඇතුලත දී මාවෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| කේ. ඇම්. හනීපා මහතා, කුඹුක්කන, මොණරාගල ... | ගවමස් වෙළඳාම ... | වැල්ලවායේ පොදු වෙළඳ පොලේ අංක 8 දරණ කඩය |

1970.10.19 වන දින,
වැල්ලවාය ගම් සභා කායභාලයේදීය.

ඩී. ඇම්. පුන්චිබණ්ඩා,
වැල්ලවාය ගම්සභාවේ සභාපති තැන.

11–203—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## මහරගම සුළු නගර සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය, ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ස්ථානවල මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, එසේ බලපත්‍ර නිකුත් කිරීම ගැන මහරගම සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කරමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වෙනි පරිච්ඡේදය) අංක 7 (2) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සභාපති,
මහරගම සුළු නගර සභාව.

### උපලේඛනය

| බලපත්‍ර ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම සහ ස්ථානය |
|---|---|
| 1. එම්. අයි. මොහොමඩ්, 36, දිගරොල්ල, මොරටුව | මහරගම පොදු වෙළඳ පොළේ අංක 1 හරක් මස් කඩය. |
| 2. ඇම්. ඇස්. ඒ. කබීර්, 36, දිගරොල්ල, මොරටුව | මහරගම පොදු වෙළඳ පොළේ අංක 2 හරක් මස් කඩය. |
| 3. කේ. ඇම්. සමීම්, 36, දිගරොල්ල, මොරටුව | මහරගම පොදු වෙළඳ පොළේ එළු මස් කඩය. |

11–212—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## පෑලියගොඩ නගර සභාව

**1971 වර්ෂයට දේපල වරිපණම් බද්ද**

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරය යටතේ 1971 අවුරුද්දට බලපවත්නා පරිදි පහත සඳහන් දේපල වරි පණම් බද්ද පැණවීමට පෑලියගොඩ නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160 (3) වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට දහය බැගින් අය කරන බවත් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දායින් අවසන්වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි බවත් දන්වනු ලැබේ.

වින්සන්ට් රාජපක්ෂ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 25 වැනි දින,
පෑලියගොඩ නගර සභා කායභාලයේදීය.

11–182/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් ‍ත්‍රය

---

## පෑලියගොඩ නගර සභාව

**1971 වර්ෂය සඳහා සුනඛ බද්ද**

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

(477 වැනි අධිකාරය) සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි ඡේදය ප්‍රකාර, පෑලියගොඩ නගර සභා සීමාව තුල ඇති කරන සෑම බල්ලෙක් සඳහා රු. 1ක් ද, සෑම බැල්ලියක් සඳහා රු. 1.50ක් ද 1971 වර්ෂය වෙනුවෙන් පනවා ඇති අතර, මෙම බද්ද 1971 අප්‍රේල් මස 1 වැනි දිනට පෙර ගෙවිය යුතුව ඇත.

වින්සන්ට් රාජපක්ෂ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 25 වැනි දින,
පෑලියගොඩ නගර සභා කායභාලයේදීය.

11–182/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## පෑලියගොඩ නගර සභාව

**රථවාහන හා සත්ව බද්ද—1971 වර්ෂය**

### නගර සභා ආඥාපනත (255 අධිකාරිය)

(255 අධිකාරිය වන) නගර සභා ආඥාපනතේ 162 වන ඡේදය අනුව, පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන පරිදි රථවාහන හා සතුන් සඳහා බද්ද, 1970 වර්ෂය තුල බල පැවැත්වූ බදු ප්‍රමාණයන්ම 1971 වර්ෂයට ද පනවා ඇති බවත්,

2. යටකී ආඥා පනතේ 163 (3) ඡේදය යටතේ එකී බද්ද 1971 මාර්තු මස 31 වෙනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්,

පෑලියගොඩ නගර සභාව මඟින් මෙයින් ප්‍රකාශයට පමුණුවනු ලැබේ.

වින්සන්ට් රාජපක්ෂ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 25 වැනි දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| 1. මෝටර් කාර්, මෝටර් ට්‍රිකාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, රික්ෂෝ, පාපැදි සහ ට්‍රයිසිකල් හැරුණුවිට අන් සෑම වාහනයක් සඳහා ... | 5 | 0 |
| 2. පාපැදි, ට්‍රයිසිකල්, පාපැදි කාර්, පාපැදි කරත්ත, ට්‍රයිසිකල් කාර් හෝ ට්‍රයිසිකල් කරත්ත සඳහා :— | | |
| (අ) වෙළඳ කටයුතු සඳහා යොදවන්නේ නම් | 5 | 0 |
| (ආ) වෙළඳ කටයුතු වලින් තොර පාවිච්චිය සඳහා ... ... | 1 | 0 |
| 3. ගොන් දෙන්නා බඳින කරත්ත සඳහා ... | 5 | 0 |
| 4. තනි ගොනා බඳින කරත්ත සඳහා ... | 3 | 0 |
| 5. තිරික්කල, බක්කි කරත්ත සහ අත්කරත්ත සඳහා ... | 3 | 0 |
| 6. රික්ෂෝ සඳහා ... ... | 2 | 50 |

11–182/3—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## කෑගල්ල නගර සභාව

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු—1971

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥා පනත (477 වෙනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි අධිකාරයේ) 4 වෙනි කොටස ප්‍රකාර කෑගල්ල නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 2 ක් ද, සෑම බැල්ලියක වෙනුවෙන් රු. 3 ක් ද ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1970 වර්ෂයේදී මෙන්ම 1971 වර්ෂයේදීද, පනවා ඇති බවද, එකී ගාස්තු 1971 අප්‍රේල් මස 1 වෙනි දිනෙන් පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පු. බ. බාලසූරිය,
කෑගල්ල නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 20 වෙනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේදීය.

11–206/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල නගර සභාව

### 1971 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

(අ) නගර සභා ආඥා පනතේ 255 වැනි අධිකාරයේ අංක 162 (1) (ඒ) වැනි වගන්තිය යටතේ පහත සඳහන් උප ලේඛනයේ නම් කරන ලද රථවාහනවලට හා සතුන්ට ඒ ලේඛනයෙහි එම වාහන සහ සතුන් ඉදිරියේ සඳහන් කර තිබෙන ගාස්තු 1970 වර්ෂයට මෙන්ම 1971 වර්ෂයට ද පනවා ඇති බවත්,

(ආ) යථෝක්ත ආඥා පනතේ 163(3) වැනි වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, ත්‍රිසිකල්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයකට ... | 5 | 0 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට, බයිසිකල් කාරයකට හෝ කරත්තයකට හෝ රෝද තුනේ කරත්තයකට හෝ කාරයකට— | | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන කටයුත්තකට පාවිච්චි කරන්නේ නම් ... ... | 1 | 0 |
| සෑම කරත්තයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 4 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක්, හෝ අශ්වතරයෙක් සඳහා ... ... | 5 | 0 |
| සෑම ගවයෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 | 0 |

පු. බ. බාලසූරිය,
කෑගල්ල නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 20 වෙනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේදී ය.

11–206/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## මාගම්පුර ගම්සභාව

### ගම්සභා ආඥාපනතේ—257 වැනි අධිකාරය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පුර ගම් සභාව විසින් 1970 ජුනි 7 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කර සිටිනු ලැබේ. එහි දැක්වෙන පාරවල් සම්බන්ධයෙන් ඉඩම් හිමියන්ගේ හෝ ප්‍රදේශ වාසීන්ගේ හෝ යම් විරෝධතාවයක් ඇත්නම් ඒ කුමන හේතුවක් හෝ හේතූන් නිසාදැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. එකී නියමිත වකවානුව තුළ එවැනි විරෝධතාවයක් නොදැක්වුවහොත් ඉන්පසු එම පාරවල් ගැසට් පත්‍රයෙහි පළ කර ඇති අන්දමට එය ඉදිරියෙන් ඇති දිග පළල අනුව ගම් සභාව සතු දේපලක් ලෙස සලකා සාදවා හෝ නැවත සාදවා පවත්වාගෙන යන බවද මෙයින් දන්වනු ලැබේ.

### යෝජනාව

1962 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ තිස්සමහාරාම, මාගම්පුර ගම් සභා ප්‍රදේශයේ ගම් සභාව විසින් 1959 ජනවාරි මස 2 වැනි දින අංක 11,633 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මත කර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවන්හි 4 වැනි වගන්තියේ ප්‍රකාර, 1969 ජුලි මස 11 වැනි දින අංක 14,862 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද පාරවල් ලැයිස්තුවට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන මංමාවත්, ඒ ඒ මංමාවත් ඉදිරියේ සඳහන් දිග පළල ඇතිව සාද හෝ නැවත සාද පවත්වාගෙන යා යුතු බවට ජී. රත්නායක හා ඩී. ඩී. නානායක්කාර යන මහතුන්ගේ යෝජනා-ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

| | පාරේ නම | | දිග සැ. | දිග ද. | දිග අ. | | පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| 41. | ගහවැලැන මැද පාර ... | ... | — | 72 | 48 | ... | 20 |
| 42. | තංජ නගරය-ටිකිරිවැව පාර | ... | — | 33 | 22 | ... | 16 |
| 43. | වැලිපොතේවල පාර (අවසාන කොටස) | | — | 27 | 18 | ... | 22 |
| 44. | කිරින්ද-පස්සවල පාර ... | ... | — | 74 | 16 | ... | 14 |

ඇම්. ජී. ඩැනී,
මාගම්පුර ගම් සභාවේ වැඩ බලන සභාපති.

1970 ඔක්තෝබර් මස 26 වැනි දින,
තිස්සමහාරාම, මාගම්පුර ගම් සභා කාර්යාලයේ දීය.

11–162—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## උඩුව පළාත ගම් සභාව—කෑගල්ල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයේ 1971 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකුණුමට [illegible] ඉල්ලුම්කර ඇති බවත්, ඒ අනුව එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන කෑගල්ල දිස්ත්‍රික්කයේ උඩුව පළාත ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ඇල්. සෙයිනුදීන්, බුලත්කොහුපිටිය | ... එළ හරක් මස් හා එළු මස් | ... බුලත්කොහුපිටියේ, ගිනිවලපිටිය අංක 41 දරණ ස්ථානය |

ජී. ආර්. ගුණරත්න ප්‍රේමලාල්,
වැඩබලන සභාපති,
උඩුව පළාත ගම්සභාව.

1970 ඔක්තෝබර් මස 23 වන දින,
බුලත්කොහුපිටිය,
ගම්සභා කාර්යාලයේදීය.

11–184—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

## කැලණිය සුළු නගර සභාව

### 1971 වර්ෂය සඳහා වරිපනම් බදු

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥා පණත යටතේ 1970 වර්ෂයට පනවා තිබූ වරිපනම් බදු 1971 වර්ෂයටද එලෙසම මෙම නගර සභා සීමාව තුළ පැනවීමට මෙම කැලණිය සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපණතේ 159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ පිහිටා ඇති, කුඹුරු හා තණකොළ කොටුහැර, සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමෙන් සියයට හයක් වූ වාර්ෂික වරිපනම් බදු පිළිවෙලින් මාර්තු 31 දායින්, ජූනි 30 දායින්, සැප්තැම්බර් 30 දායින් හා දෙසැම්බර් 31 දායින් අවසන් වන අයුරින් ත්‍රෛමාසික වශයෙන් ගෙවීමට නියමිත වේ.

ඩබ්ලිව්. කේ. ඩී. සිරිසේන,
සභාපති.

1970. 10. 24 වන දින,
කැලණිය සුළු නගර සභා කාර්යාලයේදීය.

11–152—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## නාරම්මල ගම් සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛණයෙහි සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයෙහි 1971 වර්ෂයට සතුන් මැරීම සඳහා බලපත්‍ර ඉල්ලා ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය විස්තර සහිත ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්ත වන සේ සකස් කොට, මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ, 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| එම්. වයි. මොහමඩ්, රම්මුතුගල, නාරම්මල ... | නුගගහගෙදර, පී. ඒ. ඉබුරාලෙබ්බෙ මයා. සතු "පාදිලි" වත්ත ... | මස් පිණිස එළහරක් මැරීම |

1970 ඔක්තෝබර් මස 25 දිනදී,
නාරම්මල ගම්සභා කායඞාලයේදිය.

ඒ. ජී. ඩී. දයානන්ද පතිරණ,
නාරම්මල ගම්සභාවේ සභාපති.

11–148/1—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## නාරම්මල ගම් සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි දැක්වෙන ස්ථානයන්හි 1971 වර්ෂය සඳහා මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය විස්තර සහිත ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්ත වන සේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන්, පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයෙහි 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුවන්ගේ නම සහ ලිපිනයන් | ස්ථාන | වෙළඳාම |
|---|---|---|
| එම්. වයි. මොහමඩ්, රම්මුතුගල, නාරම්මල ... | කඩහපොල මාරාගහ මුල වත්ත ... | එළහරක් මස් |
| ඒ. බාවාකනී, ගැටකහට, පහමුණේ ... | පහමුණේ අඹගහමුලහේන ... | එළහරක් මස් |

1970 ඔක්තෝබර් මස 25 දින දී,
නාරම්මල ගම්සභා කායඞාලයේදිය.

ඒ. ජී. ඩී. දයානන්ද පතිරණ,
නාරම්මල ගම්සභාවේ සභාපති.

11–148/2—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

---

## ජාඇල නගර සභාව

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥා පනත

### 1971 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වන පරිච්ඡේදයේ 4 වැනි වගන්තිය ප්‍රකාර—ජාඇල නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රුපියල් එකක් (රු. 1) සහ බැල්ලියකු වෙනුවෙන් රුපියල් එකයි ශත පණහක් (රු. 1.50) 1970 වර්ෂයේ අයකරනු ලැබුවාක් මෙන්, 1971 වර්ෂයට ද අයකිරීමට පනවා ඇති බව ද, එකී ගාස්තු 1971 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර හෝ ගෙවිය යුතු බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇම්. ජෝශප් මයිකල් පෙරේරා,
සභාපති,
ජාඇල නගර සභාව.

1970.10.19 වැනිද,
ජාඇල නගර සභා කායඞාලයේ දී ය.

11–183—70.11.5 දින අංක 14,931 දරන ගැසට් පත්‍රය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3:30 ට මුදල් ගණුදෙනු කාලය අවසන්වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත ''පිටපත'' **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ රෙජිස්ට්‍රාර්වරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ''ගැසට්'' පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරව පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළු දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| **එක් කොටසක්** | ... | ... | ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | මිළ රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 | 50 | ... | 0 | 20 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 00 | ... | 0 | 20 |
| (ආ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | ... | 0 | 15 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 60 | ... | 0 | 15 |

**දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුයි.

උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජුනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජුනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි